// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1929/41 - 2015 අගෝස්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2015.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම මේ නිවේදනයෙන්,

01. බොරලැස්ගමුව, කටුවාවල, පරමධම්ම විසුද්ධාරාමය, ශ්‍රී සද්ධානන්ද දහම් පාසල් ආදී ශිෂ්‍ය සංගමය දරන ස්ථානයේ පිහිටි '' ශ්‍රී සද්ධානන්ද දහම් පාසල් ආදී ශිෂ්‍ය සංගමය '' නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තිය විධිවිධාන වලින් නිදහස් කිරීමෙන්, ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

09-260

1A - G 22222—11 (2015/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**සංශෝධනයයි**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/59 සහ 2015.07.29 දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල භාෂා නිවේදනයේ 5A පිටුවේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවට සිදු කරන ලද සංශෝධනයන් හි ශීර්ෂය ලෙස පළ වී ඇති '' ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය '' යන්න ''ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය '' යනුවෙන් නිවැරිදි විය යුතු ය.

වයි. එම්. ඒ. එම්. බණ්ඩාර,
සහකාර අධ්‍යක්ෂ,
විද්‍යාත්මක, වාස්තු විද්‍යාඥ හා තාක්ෂණ සේවා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය
පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

2015 අගෝස්තු මස 20 වැනි දින.

09-261

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.